**වැවිලි අමාත්‍යාංශය**

**සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

# තනතුරු පුරප්පාඩු

# "යළි පිබිදෙන තේ"

# රංගිරි ප්‍රභාශ්වර ඇරයුම් මෙහෙයුමට

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ තේ වගා දිස්ත්‍රික්ක 14 ක වර්තමානයේ අක්කර 10 ට අඩු කුඩා තේ වතු හිමියන්ගේ වගා සංවර්ධනය හා ව්‍යාප්තිය එම නිෂ්පාදන පවුල්වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා විවිධ ආධාරක සේවා සපයන මෙන්ම උසස් ව්‍යවහාරයන් ස්ථාපිත කරවන රාජ්‍ය ආයතනයක් වේ.

නූතනය තුළ යාවත්කාලීන වූ දැනුම් සම්භාරයකින් යුතුව වඩාත් ප්‍රායෝගිකව සමස්ත සුළු තේ ඉඩම් හිමි ප්‍රජාව තුළ සහ සමස්ත තේ භූමිකාව තුළ උසස් උප සංස්කෘතියක් ස්ථාපිත කිරීමෙහිලා අප ආරාධනා කරන තනතුර ජාතික මට්ටමින් තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලබයි. කාලීනව මෙම උසස් මෙහෙවර ප්‍රාදේශීය මට්ටමින් ඉටු කිරීමේ හැකියාව සඳහා අධ්‍යාපනික හා ව්‍යාප්ති වශයෙන් පළපුරුදු සහ නිර්මාණශීලී දායකත්වයක් ලබාදීම සඳහා අප ආරාධනා කර සිටිමු.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති)

**කළමනාකාර සේවා ගණය (HM 1-1)**

**වයස** - වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

**වැටුප් පරිමාණය** - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 80,295-15X2,270=114,345/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**සුදුසුකම්** - **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම හෝ වැවිලි කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම.

සමග

තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් පශ්චාත් උපාධි ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබාතිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි ව්‍යාප්ති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබාතිබීම.

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි ව්‍යාප්ති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවර්ධන/ ව්‍යාප්ති කටයුතු පිළිබඳව කළමනාකාර (MM 1-1) සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකරන අතර, ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| i. | අදාළ පළපුරුද්ද | - ලකුණු 30 |
| ii. | අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | - ලකුණු 30 |
| iii. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | - ලකුණු 15 |
| iv. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | - ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | - ලකුණු 100 |

**සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගනු ලැබේ.**

**වෙනත්** - සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**අමතර ප්‍රතිලාභ** - නේවාසික හා බාහිර වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පහසුකම්

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් හා ජීවන වියදම් දීමනාවෙන් මාසිකව 10% කට නොඅඩු මුදලක් ප්‍රදානය කරනු ලබන අතර, අධිකාරිය විසින් 15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3% ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද දැක්වෙන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** - 2021 ජූලි මස 08 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති,**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර,**
**පැලවත්ත, බත්තරමුල්ල.**